**AIA Insurance Lanka PLC** (Co. No. PQ 18)

Head Office
P O Box 2088
75, Kumaran Ratnam Road,
Colombo 2, Sri Lanka
T : (+94 11) 231 0310
F : (+94 11) 244 7620
E : lk.info@aia.com

AIALIFE.COM.LK

# Media Release

## ඩෙංගු රෝගය තුරන් කිරීමට AIA එක් වේ

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග ඒකකය පවසන පරිදි අනුමාන වශයෙන් ශ්‍රී ලංකාවේ සතියකට ඩෙංගු රෝගීන් 500ක් පමණ වාර්තා වන අතර මෙම වසරේදී දැනටමත් ඩෙංගු වසංගතයෙන් මිය ගිය පුද්ගලයින් සංඛ්‍යාව 58කි. මෙම තර්ජනය මග හැරවීමේ අරමුණින් යුතුව AIA ඉන්ෂුවරන්ස් කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් පසුගියදා ඩෙංගු මදුරුවන් බෝ වන ප්‍රදේශයක් හඳුනාගනිමින් එම ප්‍රදේශය පවිත්‍ර කිරීමේ ප්‍රජා සත්කාරක ව්‍යාපෘතියක් දියත් කෙරිණි.

මෙහිදී AIA ඉන්ෂුවරන්ස්හි කාර්ය මණ්ඩල සාමාජිකයින් සිය දෙනෙකුට අධික පිරිසක් එක්ව නාරාහේන්පිට දුම්රිය ස්ථානය සහ ඒ අවට ප්‍රදේශය පවිත්‍ර කිරීමට දායක වූයේ ජලය එක්රැස් වී ඩෙංගු මදුරුවන් බෝ විය හැකි විවිධ අපද්‍රව්‍ය ඉවත් කරමිනි. මෙම ව්‍යාපෘතියෙහි තවත් පියවරක් ඉදිරියට තබමින් මෙහිදී ඔවුන් දැන්වීම් පත්‍රිකා බෙදාහරිමින් අවට පරිසරය පිරිසිදුව තබා ගැනීමේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමටද කටයුතු කළහ. මෙහිදී මෙම උවදුරෙහි භයානක බව පිළිබඳ ජනතා අවධානය යොමුකිරීම සඳහා මදුරුවන් මෙන් සැරසුනු වීදි රංගන ශිල්පීන් ද යොදා ගැනිණි.

ජාතික ඩෙංගු මර්දන ඒකකයෙහි අනුමැතිය සහිතව දියත් කෙරුනු මෙම ව්‍යාපෘතිය සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සහ සෙසු නිලධාරීන්ගේ නොමඳ සහයෝගය හිමි විය.

''ආසියානු කළාපය තුළ AIA මගින් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා ප්‍රජාව දිරිගන්වනු ලබන අතර එහිදී අපගේ ප්‍රජා සත්කාරයන් ඔස්සේ ජාතික වැදගත්කමකින් යුතු කාර්යයන් කෙරෙහි දායකත්වය සැපයෙනවා. මෙම වැඩසටහන ඔස්සේ මෙම රෝග තත්ත්වයෙහි බරපතල බව සහ එහි ශීඝ්‍ර පැතිරීම පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීමට අප කණ්ඩායමට හැකි වුනා.'' යනුවෙන් සමාගමෙහි මානව සම්පත් අධ්‍යක්ෂිකා චතුරි මුණවීර පැවසුවාය.

**ඡායාරූපය :**

ඩෙංගු රෝගය බෝ කරන මදුරුවන් ව්‍යාප්ත වීම වළකන ආකාරය පිළිබඳව ජනතාව දැනුවත් කරමින් AIA කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් දැන්වීම් පත්‍රිකා බෙදා දෙන අයුරු.

සමාප්තයි.

**Media Enquiries:**

**Suren Perera, Head of Marketing & Company Spokesman**

**Office – 2310028, Mobile – 0773 457 959**